<u>**කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේදිය.**</u>

<u>**අතිරේක දිවුරුම් ප්‍රකාශය**</u>

නඩු අංකය: 68647/04

1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහයේ 136 (1) (අ) වගන්තිය ප්‍රකාරව කරනු ලබන ඉල්ලීමයි.

1. *සාපරාධී විශ්වාසය කඩකිරීම (ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 388 වන වගන්තිය)*
2. *බැංකු කරුවෙකු විසින් සිදුකරනු ලබන සාපරාධී විශ්වාසය කඩකිරීම (ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 392 වන වගන්තිය)*
3. *මුදල් වංක ලෙස සහ සාවද්‍ය ලෙස පරිහරණය කිරීම (ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 386 වන වගන්තිය)*
4. *1937 අංක 07 දරන (සංශෝධිත) ආඥා පනතේ (Registered Stock and Securities Ordinance) අංක 56(අ)1(අ) යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදු කිරීම*

**රජිත් කීර්ති තෙන්නකෝන්**
අංක 482/4,
රාජගිරිය පාර,
රාජගිරිය.

<u>**පැමිණිලිකරු**</u>

-එදිරිව-

**අජිත් නිවාඩ් කබ්රාල්**
අංක 32/7,
පාසැල් මාවත,
නාවල.

<u>**චූදිත**</u>

රාජගිරිය, රාජගිරිය පාර, අංක. 482/4 දරණ ස්ථානයේ පදිංචි රජිත් කීර්ති තෙන්නකෝන් වන මම බෞද්ධයෙකු වශයෙන් සත්‍යතා පූර්වකව ප්‍රතිඥා දි ප්‍රකාශකොට සිටින වග නම්,

මෙම කරුණු මාගේ පුද්ගලික දැනුම, මා හට පරිශීලනය කිරීමට ලැබී ඇති ඇති ලේඛණ මත සත්‍ය බවටත් නිවැරදි බවටත් මම ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් නීතිමය කරුණක් සඳහන් වන්නේ ද එකී කරුණු නීතිමය උපදෙස් මත මම ප්‍රකාශ කරමි.

1. ඉහත අංක දරණ නඩුවේ පැමිණිලිකරු සහ මෙම දිවුරුම් ප්‍රකාශයේ සිද්ධි ප්‍රකාශක මම වෙමි.

2. මා ප්‍රකාශ කර සිටින්නේ,

   අ) මාගේ මුල් දිවුරුම් ප්‍රකාශය මගින් දක්වා ඇති 2022 ජනවාරි මස 18වන දින ශ්‍රී ලංකා රජය විසින් ගෙවන ලද ඇමරිකානු ඩොලර් මිලියන 500කට අදාළ ජාත්‍යන්තර ස්වෛරී බැදුම්කරයන්ට අදාළ ගෙවීම් ඉතාම සැක සහිත බවට පාර්ලිමේන්තු මන්ත්‍රී ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා විසින් අවස්ථා කිහිපයකදී සදහන් කරනු ලැබ ඇති බවත්,

   ආ) විපක්ෂය විසින් අවස්ථා ගණනාවකදීම එකී ජාත්‍යන්තර ස්වෛරී බැදුම්කරයන්ට අදාළ ගෙවීම් ලබා ගත් බැදුම්කර දරන්නන් කවුරුන්ද යන්න හෙළිදරවු කරන ලෙසට අදාළ බලධාරීන්ගෙන් ඉල්ලීම් කර ඇති නමුත් එකී ඉල්ලීමට මේ දක්වා ප්‍රතිචාර ලැබී නොමැති බවට දක්වනු ලැබ ඇති බව ය.

   *මේ සම්බන්ධයෙන් ආචාර්ය හර්ෂ සිල්වා විසින් රචිත ලිපියක සත්‍ය මුද්‍රිත පිටපතක් ඒ15 වශයෙන් ලකුණු කර මෙහිම කොටසක් සහ අංගයක් වශයෙන් ඉදිරිපත් කර සිටී.*

3. මා ප්‍රකාශ කර සිටින්නේ, 2022 ජනවාරි මස 18වන දින ඇමරිකානු ඩොලර් මිලියන 500කට අදාළ ජාත්‍යන්තර ස්වෛරී බැදුම්කරයන්ට අදාළ ගෙවීම් ශ්‍රී ලංකා ජනරජය විසින් ගෙවන ලද්දේ කා හටද යන්න නිශ්චිතව අනාවරණය කර ගැනීම මෙම නඩු කටයුත්ත සඳහා ද අවශ්‍ය කාරණයක් වන බව ය.

4. මා ප්‍රකාශ කර සිටින්නේ, ඒ අනුව ඇමරිකානු ඩොලර් මිලියන 500කට අදාළ ජාත්‍යන්තර ස්වෛරී බැදුම්කරයන්ට අදාළ ගෙවීම් ශ්‍රී ලංකා ජනරජය විසින් 2022 ජනවාරි මස 18වන දින ගෙවන ලද පාර්ශවයන්ගේ නම් ඇතුළත් ලැයිස්තු මෙම ගරු අධිකරණය වෙත ඉදිරිපත් කරන මෙන් ශ්‍රී ලංකා මහ බැංකුවෙහි අධිපතිවරයාට සහ භාණ්ඩාගාරයෙහි ලේකම්වරයාට සහ මුදල් අමාත්‍යාංශයෙහි ලේකම්වරයාට නියෝගයක් නිකුත් කරවා ගැනීමට මා හට කරුණු උපචය වී ඇති බව ය.

5. මා ප්‍රකාශ කර සිටින්නේ, මෙම නඩු කටයුත්තට අදාළ වන ඇමරිකානු ඩොලර් මිලියන 500කට අදාළ ජාත්‍යන්තර ස්වෛරී බැදුම්කරයන්ට අදාළ ගෙවීම් ශ්‍රී ලංකා ජනරජය විසින් 2022 ජනවාරි මස 18වන දින ගෙවන ලද අවස්ථාවෙහි ශ්‍රී ලංකාවෙහි මුදල් ඇමතිවරයා

වශයෙන් කටයුතු කරන ලද්දේ බැසිල් රෝහණ රාජපක්ෂ යන අය බවත් ඔහු එකී තනතුරට 2021 ජුලි 08වන දින පත් වන ලද බවත් ය.

*එකී පත්වීම සම්බන්ධයෙන් පළ කර ඇති ලිපියක සත්‍ය මුද්‍රිත පිටපතක් ඒ16 වශයෙන් ලකුණු කර මෙහිම කොටසක් සහ අංගයක් වශයෙන් ඉදිරිපත් කර සිටී.*

6. මා ප්‍රකාශ කර සිටින්නේ, එකී බැසිල් රෝහණ රාජපක්ෂ යන අය අමාත්‍ය ධූරය දරන ලද මුදල් අමාත්‍යාංශයෙහි ලේකම්වරයා නිල බලයෙන් ශ්‍රී ලංකා මහබැංකුවෙහි මුදල් මණ්ඩලයෙහිද සාමාජිකයෙකු වන බවත් එමෙන්ම මෙරට මූල්‍ය ප්‍රතිපත්තියෙහි තීරණය කිරීමෙහිලා ප්‍රමුඛතම කාර්යයක් මුදල් අමාත්‍යවරයා විසින් දරනු ලබන බවත් ය.

7. මා තවදුරටත් ප්‍රකාශ කර සිටින්නේ, මාගේ මුල් දිවුරුම් ප්‍රකාශයෙහි දක්වා ඇති ආචාර්ය රෝහණ ලක්ෂ්මන් පියදාස විසින් සිදු කරනු ලැබ ඇති ප්‍රකාශයෙහි සඳහන් බැඳුම්කරවල ආයෝජනය කර ඇත්තේද රාජපක්ෂලාගේ නෑයන් සහ මිත්‍රයන් ආදී වශයෙන් සඳහන් ප්‍රකාශයෙහි දක්වා ඇති රාජපක්ෂවරු අතරට බැසිල් රෝහණ රාජපක්ෂ යන අයද ඇතුළත් බවට පෙනී යන බව ය.

8. මා ප්‍රකාශ කර සිටින්නේ, ඉහත කී ඇමරිකානු ඩොලර් මිලියන 500ක වටිනාකමැති ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කරයන් ගෙවන බවට එකී බැසිල් රෝහණ රාජපක්ෂ යන අයද ප්‍රකාශ නිකුත් කර තිබූ බව ය.

*ඒ සම්බන්ධයෙන් පළ කර ඇති ලිපියක සත්‍ය මුද්‍රිත පිටපතක් ඒ17 වශයෙන් ලකුණු කර මෙහිම කොටසක් සහ අංගයක් වශයෙන් ඉදිරිපත් කර සිටී.*

9. මා ප්‍රකාශ කර සිටින්නේ, එකී බැසිල් රෝහණ රාජපක්ෂ සහ මුදල් අමාත්‍යාංශයෙහි එවකට ලේකම්වරයා වශයෙන් කටයුතු කරන ලද එස්. ආර්. ආටිගල යන අය මෙම නඩුවෙහි අත්‍යාවශ්‍ය සාක්ෂිකරුවන් වන බවත් විශේෂයෙන්ම මෙම නඩුවෙහි දක්වා ඇති 06වන චෝදනාව සම්බන්ධයෙන් සැකකරුවන් වශයෙන් නම් කිරීමේ හැකියාව ද පවතින අයවලුන් වන බවත් ය.

*එස්. ආර්. ආටිගල යන අය මුදල් අමාත්‍යාංශයෙහි ලේකම්ධූරයෙන් ඉල්ලා අස්වීම සම්බන්ධයෙන් සම්බන්ධයෙන් පළ කර ඇති ලිපියක සත්‍ය මුද්‍රිත පිටපතක් ඒ18 වශයෙන් ලකුණු කර මෙහිම කොටසක් සහ අංගයක් වශයෙන් ඉදිරිපත් කර සිටී.*

10. මා ප්‍රකාශ කර සිටින්නේ,

I. මෙවන් ආකාර වංචානික ක්‍රියාවලියක් මෙහෙයවීයැයි නීතිපතිවරයා විසින් PTB/01/05/2019 දරන නඩුවෙහි අධි චෝදනා ගොනු කරනු ලැබූ ශ්‍රී ලංකා මහබැංකු අධිපතිවරයෙකු වන ලක්ෂ්මන් අර්ජුන් මහේන්ද්‍රන් යන මේ වන විටත් අධිකරණ ක්‍රියාවලියෙන් බැහැරව විදේශගතව සිටින බවත්,

II. එකී බැසිල් රෝහණ රාජපක්ෂ යන අය ඇමරිකානු එක්සත් ජනපදයෙහි පුරවැසියෙකු ද වන බවත් බැසිල් රෝහණ රාජපක්ෂ සහ එස්. ආර්. ආටිගල යන අය එයාකාරයට මෙරටින් බැහැර වී ගියහොත් බරපතළ අගතියක් මා වෙත මෙන්ම මෙරට යුක්තිය පසිඳලීමෙහි ක්‍රියාදාමයටද එල්ල විය හැකි බවත් ය.

*ස්වකීය ද්විත්ව පුරවැසිභාවය සම්බන්ධයෙන් බැසිල් රෝහණ රාජපක්ෂ යන අය සිදු කර ඇති ප්‍රකාශයක සත්‍ය මුද්‍රිත පිටපතක් ඒ19 වශයෙන් ලකුණු කර මෙහිම කොටසක් සහ අංගයක් වශයෙන් ඉදිරිපත් කර සිටී.*

III. ඒ අනුව බැසිල් රෝහණ රාජපක්ෂ සහ එස්. ආර් ආටිගල යන අයට එරෙහිව 1948 අංක 20 දරන ආගමන සහ විගමන ආඥා පනතේ 51 ඇ) වගන්තිය සහ අපරාධ නඩු විධාන සංග්‍රහයෙහි ප්‍රතිපාදන අනුව විදේශ ගමන් තහනමක් පනවා ගැනීමේ අවස්ථාවෝචිත තත්වයක් පැණ නැගී ඇති බවත් ය.

11. ඒ අනුව මා මෙම ගරු අධිකරණයෙන් අයැද සිටින්නේ,

I. ඇමරිකානු ඩොලර් මිලියන 500කට අදාළ ජාත්‍යන්තර ස්වෛරී බැදුම්කරයන්ට අදාළ ගෙවීම් ශ්‍රී ලංකා ජනරජය විසින් 2022 ජනවාරි මස 18වන දින ගෙවන ලද පාර්ශවයන්ගේ නම් ඇතුළත් ලැයිස්තුවක් මෙම ගරු අධිකරණය වෙත ඉදිරිපත් කරන මෙන් ශ්‍රී ලංකා මහ බැංකුවෙහි අධිපතිවරයාට සහ භාණ්ඩාරගාරයෙහි ලේකම්වරයාට නියෝගයක් නිකුත් කරන ලෙසත්,

II. බැසිල් රෝහණ රාජපක්ෂ සහ එස්. ආර්. ආටිගල යන අයට එරෙහිව 1948 අංක 20 දරන ආගමන සහ විගමන ආඥා පනතේ 51 ඇ) වගන්තිය සහ අපරාධ නඩු විධාන සංග්‍රහයෙහි ප්‍රතිපාදන අනුව විදේශ ගමන් තහනමක් පනවන ලෙසත් වේ.

ඉහත සඳහන් ප්‍රකාශයන් පැහැදිලි කර කියවා තේරුම් කර දිමෙන් පසු මෙහි නම සඳහන් අය විසින් එය ස්ථිරකොට ප්‍රතිඥා දි වර්ෂ 2022 ක් වු අප්‍රේල් මස 18වන දින කොළඹ දි මා ඉදිරියේදි අත්සන් තබන ලදි.

මා ඉදිරිපිටදි ය.

දිවුරුම් කොමසාරිස්